*සැ. යු.* - (i) 2020.03.13 වැනි දින පළ වූ අංක 2167 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2020 වර්ෂය සඳහා ගාල්ල - බලපිටිය දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,168 - 2020 මාර්තු මස 20 වැනි සිකුරාදා - 2020.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 86 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 88 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 අප්‍රේල් මස 09 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 මාර්තු මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


85 - B 82019 - 353 (2020/03)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ කොළඹ දිස්ත්‍රික්කයේ, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් හේරත් මුදියන්සේලාගේ නන්දසේන වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ, 19(4) උප වගන්තිය යටතේ, අතිගරු ජනාධිපති විසින් 1996.03.25 වැනි දින ප්‍රදානය කර ඇති අංක කො/ප්‍ර/හං 968 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පින්නවල උතුර පදිංචි සිංගප්පුලිගේ එලිසනෝනා වෙත ප්‍රදානය කොට අවිස්සාවෙල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එන්. 5/89 යටතේ 1996.03.27 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නිත්‍යානුකූල හිමි අයෙක් නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.04.17 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පත්තුවේ පින්නවල උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පින්නවල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක - දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි /ඒ 210 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 20න් කොටසක් දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් රූඩ් 02 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : හොරගහලන්ද නැමති ඉඩම,

| | | |
|---|---|---|
| *උතුරට* | : | ප්‍රවේශ මාර්ගය, |
| *නැගෙනහිරට* | : | මු. පී. ඒ. 210 පිඹුරේ අංක 16, 17 සහ 19 ඉඩම් ද, |
| *දකුණට* | : | මු. පී. 17193 අංක 07 දරන ඉඩම ද, |
| *බටහිරට* | : | වික්‍රමසිංහගේ බේබිනෝනාට දී තිබුන හොරගහලන්ද නමැති ඉඩම. |

එච්. එම්. නන්දසේන,
ප්‍රාදේශීය ලේකම්,
පාදුක්ක.

2019 සැප්තැම්බර් මස 12 වැනි දින.

03-709/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් බුද්ධි තරංගා කරුණාසේන වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ, 19(4) උපවගන්තිය යටතේ, අතිගරු ජනාධිපති විසින් 1983.02.21 වැනි දින ප්‍රදානය කර ඇති අංක කො/ප්‍ර/326 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන (ලිපිනය සඳහන් කර නොමැත) සිංගන්කුට්ටි ආරච්චිගේ ඉන්ද්‍රානි මහත්මිය වෙත ප්‍රදානය කොට කොළඹ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඉසදී/එන් 1/8 යටතේ 1984.03.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නිත්‍යානුකූල හිමි අයෙක් නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.04.17 වැනි දිනට පෙර මා වෙත දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහ සල්පිටි පත්තුවේ/කෝරළයේ බටහිර කිරිවත්තුඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දියගම නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, හෝමාගම ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අනුරේඛනයේ අංක කො. 5906 දරන කට්ටි කැඩීමේ පිඹුරේ කැබලි අංක 02 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0661 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | - , |
| *නැගෙනහිරට* | : | මු. පි. කො. 5906 හි කැබලි අංක 03, |
| *දකුණට* | : | මු. පි. කො. 5906 හි කැබලි අංක 04 (පාර), |
| *බටහිරට* | : | මු. පි. කො. 5906 හි කැබලි අංක 01 (ගම්සභා පාර). |

බුද්ධි තරංගා කරුණාසේන,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2019 ඔක්තෝබර් මස 09 වැනි දින.

03-709/2

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් බුද්ධි තරංගා කරුණාසේන වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ, 19(4) උපවගන්තිය යටතේ, අතිගරු ජනාධිපති විසින් 1983.02.21 වැනි දින ප්‍රදානය කර ඇති අංක කො/ප්‍ර/328 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන (ලිපිනය සඳහන් කර නොමැත) ආරියප්පෙරුම රත්නායකගේ දොන් සෙනෙවිරත්න වෙත ප්‍රදානය කොට කොළඹ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඉසදී/එන් 1/10 යටතේ 1984.03.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙක් නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.04.17 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහ සල්පිටි පත්තුවේ/කෝරළයේ බටහිර කිරිවත්තුඩුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දියගම නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, හෝමාගම ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අනුරේඛනයේ අංක කො. 5907 දරන කට්ටි කැබීමේ පිඹුරේ කැබලි අංක 71 කොටසක් වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0763 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මූ. පි. කො. 5907 හි කැබලි අංක 69 හා 70, |
| *නැගෙනහිරට* | : | මූ. පි. කො. 5907 හි කැබලි අංක 68(පාර), |
| *දකුණට* | : | මූ. පි. කො. 5907 හි කැබලි අංක 68 (පාර), |
| *බටහිරට* | : | මූ. පි. කො. 5907 හි කැබලි අංක 68 (පාර). |

බුද්ධි තරංගා කරුණාසේන,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2019 ඔක්තෝබර් මස 10 වැනි දින.

03-709/3

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

ඌව පළාත් සභාවේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් (අන්තර් පළාත්) ආර්. බී. එන්. ආර්. ප්‍රියශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ, 19(4) උපවගන්තිය යටතේ, අතිගරු ජනාධිපති විසින් 1995.11.06 දින වැනි ප්‍රදානය කර ඇති MO/PRA 9459 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන 512, දළුක්කැටිය, මුතුමිණිගම, සෙවනගල පදිංචි ලිහිණිකඩුව ආරච්චිලාගේ කලෝනෝනා වෙත ප්‍රදානය කොට මොණරාගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/M9/70 යටතේ 1996.11.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙක් නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.04.17 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිත්තරම් පළාත පත්තුවේ/කෝරළයේ මුතුමිණිගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දළුක්කැටිය නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ......... භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ...... දරන කට්ටි කැබීමේ පිඹුරේ ....... විසින් සම්පාදිත අංක .......... දරන රේඛා සටහනේ අංක 512 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් පර්චස් 60ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ග රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 513, |
| *දකුණට* | : | කැබලි අංක 526, |
| *බටහිරට* | : | කැබලි අංක 511. |

ආර්. බී. එන්. ආර්. ප්‍රියංගනී,
ප්‍රාදේශීය ලේකම්,
සෙවනගල.

2019 නොවැම්බර් මස 13 වැනි දින.

03-709/4

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/60834.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :-
පඉකො/06/1/පාන/02.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 684 ඒ, බටහිර මාලමුල්ල ග්‍රාම නිලධාරී වසමේ මාලමුල්ල ගමේ KA/PND/14/692 අංක දරන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ මගින් දක්වා ඇති ප්‍රමාණයෙන් පර්චස් 10ක් වූ රජයේ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා බටහිර මාලමුල්ල අවමංගල්‍යාධාර සුභ සාධක සමිතියේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : මූ. පි. ක. 3750 හි කැබලි අංක 03;
*නැගෙනහිරට* : මූ. පි. ක. 3750 හි කැබලි අංක 03 ;
*දකුණට* : මූ. පි. ක. 3750 හි කැබලි අංක 03 ;
*බටහිරට* : මූ. පි. ක. 3750 හි කැබලි අංක 05 (මාර්ගය).

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු පහයි (05). (ගරු ඇමතිතුමා අනුමත කළ 2020.02.12 දින සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2020 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%කි.

*(ආ)* මෙම ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

නුවනි සුදුසිංහ,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 මාර්තු මස 20 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-771

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.